මාධ්‍ය නිවේදන අංක 03

**මැතිවරණ කොමිෂන් සභාව**

# මාධ්‍ය නිවේදනයයි.

- මැතිවරණ කොමිෂන් සභාව සහ පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සමඟ 2022 ඡන්දහිමි නාම ලේඛනය ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් වූ සාකච්ඡාවක් **2022 පෙබරවාරි 23** වන දින පෙරවරු **10.00** ට **මැතිවරණ මහලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේ දී** පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- ඉදිරියේ දී පැවැත්වෙන ඡන්ද විමසීම්වල දී මැතිවරණ නීතිය, පරිපාටික නීතිය, විධාන හා උපමාන භාවිතා කිරීමේ දී මෙතෙක් මතු වූ අවහිරතා මඟහැර නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ නීතීය දායක කරගන්නා ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්, මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකවල නිලධාරීන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති අතර මෙම පුහුණු වැඩමුළු සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ලබන මාර්තු මස අවසානයට පෙර පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු සම්පාදනය කොට ඇත.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 පෙබරවාරි මස 18